සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

| 23 | S | I |
|---|---|---|

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

## Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ............................ **දේශපාලන විද්‍යාව I** කාලය පැය දෙකයි

- **1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට (1,2,3,4,5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරාගෙන ලකුණු කරන්න.**
- **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

❖ **ප්‍රශ්න අංක 01 සිට 15 දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහෙන් හතරක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශ අයත් කාණ්ඩය තෝරන්න.**

01. දේශපාලන විද්‍යාව
A මිනිසාගේ දේශපාලන චර්යාව අධ්‍යයනය කරයි.
B අනෙකුත් සමාජ විද්‍යා විෂයයන් සමඟ සමීප සබඳතාවක් දක්වයි.
C මූලික සංකල්ප සමඟ පොදු එකඟතාවක් දක්වයි.
D සාධක පාලනය කරමින් පර්යේෂණය නොකරයි.
E ශුද්ධ විද්‍යාත්මක ශිල්ප ක්‍රම භාවිතා නොකරයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

02. දේශපාලනය
A ආණ්ඩුවේ ප්‍රායෝගික ක්‍රියාකාරීත්වයයි.
B බලය හා සම්බන්ධ තරඟකාරී ක්‍රියාවලියයි.
C ප්‍රජාතන්ත්‍රවාදීව හෝ වෙනත් ඕනෑම අයුරකින් ක්‍රියාත්මක වන බල අරගලයයි.
D මානවයා දිගු කාලයක් ගොඩනැගු න්‍යාය හා දර්ශනයන්ගේ එකතුවයි.
E ආණ්ඩුවක් ලෙස සංවිධානාත්මකව බලය ක්‍රියාත්මක කිරීමේ කලාවයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

03. දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් ලෙස සැලකෙන්නේ,
A එය විද්‍යාගාර පර්යේෂණයන්හි ප්‍රතිඵලයක් නිසාය.
B එය පුද්ගල චර්යාව අධ්‍යයනය කරන්නක් වීම නිසාය.
C එය ගතික විෂයයක් ලෙස පිළිගැනෙන නිසාය.
D විෂය ක්ෂේත්‍රය කලානුරූපව වෙනස්වීම් වලට බඳුන්වන නිසාය.
E අනෙකුත් සමාජ විද්‍යාවන් සමඟ දක්වන සමීප සබඳතාවය නිසාය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

04. රාජ්‍යය
A දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය සාධකය වේ.
B බලය සඳහා විධිමත්ව සංවිධානය වූ මිනිස් සමාජයක දක්නට ලැබේ.
C මිහිපිට බිහිවූ උත්තරීතර හා පාරිශුද්ධ ආයතනය බව සියලු දේශපාලන න්‍යායයන් පිළිගනී.
D බිහිවූයේ කවදාද ඒ වූ අයුරින්ම අදද දැකිය නොහැකි බව පිළිගැනේ.
E ප්‍රජා පීඩන උපකරණයන් ලෙස සමාජ සම්මුතිවාදීන් නොදකිති.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

05. ජාතික රාජ්‍ය බිහිවීම සඳහා
A මුදල් සංසරණ ආර්ථික රටාව බිහිවීම හේතුවක් විය.
B අතින් කළ දේ වෙනුවට යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීමේ පෙරළිය සිදුවීම හේතුවක් විය.
C වැඩවසම් ක්‍රමයේ අභාවය බලපෑවේය.
D එක් ජාතියකට එක් රාජ්‍යයක් යන සංකල්පය බලපෑවේය.
E පාප් අධිරාජ්‍යයේ වර්ධනය ක්‍රමානුකූල පසුබිමක් සපයන ලදී.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

06. ආණ්ඩුව
A රාජ්‍යයේ ස්වාමියා ලෙස ක්‍රියාත්මකයි.
B දෘශ්‍යමාන බලවේගයක් ද වෙයි.
C පූර්ණ මිනිසා බිහිකිරීමේ රාජ්‍ය අරමුණ ක්‍රියාත්මක කරයි.
D රාජ්‍යයේ සියලු සාමාජිකයන්ගෙන් යුක්ත නොවෙයි.
E රාජ්‍ය සතු ස්වාධිපති බලය ක්‍රියාවට නංවයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

07. නව රාජ්‍ය සංකල්පයට අදාල රාජ්‍යයන් වන්නේ,
A දෙවන ලෝක යුද්ධයෙන් පසුව නිදහස ලැබූ රාජයයන් ය.
B ආර්ථික වශයෙන් අසංවර්ධිත රාජ්‍යයන්ය.
C සමස්ථ දේශපාලන රටාව නවීකරණය වී නැති රාජ්‍යයන්ය.
D ජාති වර්ග ආගම් ආදී ලෙස සමාජය බෙදී සිටී රාජ්‍යයන්ය.
E නැගෙනහිර කඳවුරේ රාජ්‍යයන්ය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

08. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක මූලිකාංගවලට අදාල වන්නේ,
A ව්‍යවස්ථානුකූලවාදය
B නිදහස් හා සාධාරණ මැතිවරණ
C විධායකය විසින් නීතිය හැසිරවීම.
D බහු පක්ෂ ක්‍රමය
E නිදහස් ජනමාධ්‍ය
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

09. කැබිනට් ආණ්ඩු ක්‍රමයක නාමික විධායකය
A බොහෝවිට අගමැතිගේ කැමැත්ත මත පත්වේ.
B දේශපාලන පක්ෂයක් නියෝජනය නොකරයි.
C ඍජු මහජන නියෝජිතයෙක් නොවේ.
D ව්‍යවස්ථාදායකය තුළ දෝෂාභියෝගයක් සම්මත කිරිමෙන් පමණක් ඉවත්කළ හැක.
E අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය ඔහුගේ නාමයෙන් විධායක කටයුතු මෙහෙයවයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

10. ඒකීය ආණ්ඩු ක්‍රමයක
A තනි මධ්‍යම ආණ්ඩුවක් බලය භුක්තිවිඳී
B එකම රටතුළ ද්විත්ව පුරවැසි බවක් නැත.
C ආණ්ඩුවේ බලය ප්‍රාදේශීකව බෙදා නැත.
D ප්‍රාදේශික ව්‍යවස්ථාදායකයයන්ගෙන් නියෝජිතයන් මධ්‍යම ව්‍යවස්ථාදායකයට තෝරා ගනී.
E ස්වාධිපති බලය බෙදී නැත.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

11. සන්ධීය ආණ්ඩු ක්‍රමයක,
A ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇත.
B ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනම්‍ය වේ.
C ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බලතල පංගුකර නැත.
D බහුවිධතාවය සහිත රටකට වඩාත් ප්‍රයෝජනවත් වේ.
E ද්වි මාණ්ඩලික ව්‍යස්ථාදායකයක් දැකිය හැක.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

12. සමානුපාතික නියෝජන ක්‍රමය
A බහුවිධ සමාජයකට වඩාත් ඵලදායි වේ.
B ඡන්ද අපතේ යාම හීන වේ.
C සංකීර්ණ බවින් වඩාත් වැඩිය.
D සැමට නියෝජනයක් යන සංකල්පයට ප්‍රායෝගික වටිනාකමක් ලබාදෙයි.
E ඒකාධිපති ආණ්ඩුවකට මග සාදයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

13. සරල බහුතර නියෝජනය
A පළමුව දිනුම් කණුව පසුකරන්නා ජයග්‍රාහකයා කරයි.
B හැම ඡන්දයකටම වටිනාකමක් ලබාදෙයි.
C ඡන්ද ගණනය කිරීම ඉතා පහසුය.
D ඡන්ද දායකයාට වගකියන නියෝජිතයෙකු බිහි කරයි.
E පක්ෂ ප්‍රතිපත්තිසේම පුද්ගල ජනප්‍රිය බවටද ඉඩ ලබාදෙයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

14. ධනවාදී ආණ්ඩුක්‍රමයක මූලික ලක්ෂණයන් වන්නේ,
A පෞද්ගලික දේපල ක්‍රමයයි.
B ඉල්ලුම සැපයුම මත මිල තීරණය වීමයි.
C රජය ව්‍යවසාය කටයුතු වලින් ඉවත් වීමයි.
D ආර්ථිකය පාලනය කිරීමෙන් රජය මුළුමනින්ම ඉවත් වීමයි.
E නිදහස් ව්‍යවසායකත්වය පිළිගැනීමයි.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

15. සමාජවාදී ආණ්ඩු ක්‍රමයක,
A පොදු දේපල ක්‍රමය පිළිගනී.
B තනි දේශපාලන පක්ෂයක් ක්‍රියාත්මක වේ.
C වෙළඳපොල බලවේග ක්‍රියාත්මක නොවේ.
D දේපල ඉපයීමේ නිදහස සීමාවේ.
E ජනමාධ්‍ය මුළුමනින්ම නිදහස්ය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

❖ **16 සිට 25 දක්වා ප්‍රශ්න සඳහා ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාලව ප්‍රකාශ පහක් ලබාදී ඇත. ඉන් එක ප්‍රකාශයක් සාවද්‍ය වේ. එම සාවද්‍ය ප්‍රකාශය තොරන්න.**

16. දේවවරම්වාදයට අනුව,
1. රාජ්‍ය නිර්මාණය කර ඇත්තේ දෙවියන් විසිනි.
2. පාලකයා දෙවියන් වහන්සේට වග කිව යුතුය.
3. රාජ්‍ය පවතින්නේ දෙවියන් වහන්සේගේ කැමැත්ත ඇති තාක් පමණි.
4. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් නිර්මාණය වීමට මග පාදයි.
5. ලෞකික සහ ලෝකෝත්තර සියල්ලේ පදනම දේව නීතියයි.

17. සමාජ සම්මුතිවාදී න්‍යාය,
1. රාජ්‍ය සමාජයේ එකඟතාවය මත බිහිවූවක් බව කියයි.
2. හොබ්ස්, ලොක්, රූසෝ යන චින්තනයන් තිදෙනාගේ මුල්වීමෙන් බිහි විය.
3. ඒක පාර්ශ්වික මෙන්ම ද්වි පාර්ශවික සම්මුතින් පිළිබඳ කරුණු දන්වයි.
4. ජෝන් ලොක්ට අනුව දේපල යනු මිනිස් ශ්‍රමය ස්වාභාවික සම්පත් සමඟ මිශ්‍ර කිරීමේ ප්‍රතිඵලයයි.
5. වඩාත්ම ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ පාලකයා පිළිබඳව හොබ්ස් කථා කරයි.

18. රාජ්‍ය පිළිබඳ විකාශනාත්මක වාදය,
1. රාජ්‍යයේ දිගුකාලීන විකාශය පිළිබඳ කරුණු දක්වයි.
2. මිනිසුන් එකට එක්වීම රාජ්‍යයේ ආරම්භය ලෙස පැහැදිලි කරයි.
3. රාජ්‍ය සදාකාලික ආයතනයක් නොවන බව කියයි.
4. සමාජ බන්ධන මිනිසුන් එකට එක්විම සඳහා බලපෑ ප්‍රධාන සාධකය ලෙස හඳුන්වයි.
5. රාජ්‍ය ගෝත්‍ර රාජ්‍යයෙන් ආරම්භ වී ජාතික රාජ්‍ය දක්වා ගමන් කර ඇතැයි සඳහන් කරයි.

19. රාජ්‍ය, සමාජවාදීන්ට අනුව,
1. තෘප්තිමත් සහ ප්‍රීතිමත් මිනිසා නිර්මානය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වෙයි.
2. පංති භේදය පවත්නාතාක් රාජ්‍ය පවතී.
3. ප්‍රජා පීඩක උපකරණය කි.
4. උත්තරීතර කොමියුනිස්ට් සමාජය අවධිය දක්වා සමාජ අවධීන් හයක් ගැන අදහස් දක්වයි.
5. අනාගත උත්තරීතර කොමියුනිස්ට් සමාජ අවධියේදී රාජ්‍ය වියළී යන බව ප්‍රකාශ කරයි.

20. යහපාලනය සඳහා අවශ්‍ය මූලික කොන්දේසි වනුයේ,
1. අධිකරණයේ ස්වාධීනත්වයයි
2. තරගකාරී පක්ෂ ක්‍රමයයි
3. පාලනය වූ ජනමාධ්‍යයක් පැවතීමයි.
4. ආණ්ඩුවේ විනිවිද භාවයයි.
5. නිදහස් හා සාධාරණ මැතිවරණ නිසිකලට පැවැත්වීමයි.

21. දේශපාලන පක්ෂයක කාර්යයන් වන්නේ,
1. ජනතාව දැනුවත් කිරීමයි.
2. විසිරීගිය මහජන මතය එක් මතයක් ලෙසට ගෙන ඒමයි.
3. නිවැරදි දේශපාලන සමාජානුයෝජනයක් ඇති කිරීමයි.
4. බලය ලබා ගැනීමේ අරමුණින් පමණක් ක්‍රියාත්මක වීමයි.
5. නායකයන් බිහි කිරීම සහ පුහුණු කිරීමයි.

22. සිවිල් සමාජයක පොදු ලක්ෂණ වන්නේ,
1. ආණ්ඩුව, වෙළඳපොල, පවුල ප්‍රධාන වශයෙන් ඇතුලත් වීම.
2. දේශ සීමා නිශ්චිත ලෙස හඳුනා ගත නොහැකි වීම.
3. බලය යෙදීමෙන් තොරවීම.
4. සාමූහික ක්‍රියාවන්ගෙන් සමන්විත වීම.
5. ජනතාව දේශපාලන වශයෙන් බල ගැන්වීම් කිරීම.

23. මූලික අයිතිවාසිකම්,
1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකින් සහතික කළ ඒවා වේ.
2. යුතුකම් සහ නිදහස සමඟ ඍජුව සම්බන්ධ වේ.
3. නීතිමය වැදගත්කමින් තොරවේ.
4. බොහෝ විට ශ්‍රේෂ්ඨාධිකරණයන් විසින් ආරක්ෂාකර දේ.
5. මානව අයිතිවාසිකම් වලින් අදාල රටට අවශ්‍ය ලෙස උපුටා මූලික නීතියට ඇතුලත් කළ ඒවාවේ.

24. අමරිකානු විධායකය පාලනය කිරීම සඳහා පනවා ඇති විධිවිධානයන් වන්නේ,
1. ජනපතිගේ වාර්ෂික අයවැය ලේඛනය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයෙන් අනුමත විය යුතු වීම.
2. බොහෝ තනතුරු ජනපතිවරයා පත්කළත් අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට බලය සෙනෙට් මණ්ඩලයට ලබා දීම.
3. දෝෂාභියෝග යෝජනාවක් විභාගකොට ජනපති ඉවත් කිරීමේ බලය සෙනෙට් මණ්ඩලය සතු වීම.
4. ජනපතිවරයාට විදේශ ගිවිසුම් සඳහා අනුමැතිය සෙනෙට් සභාවේ තුනෙන් දෙකක බහුතරයකින් ලබාගත යුතු වීම.
5. ඕනෑම අවස්ථාවක කිසියම් වරදක් හේතුවෙන් ජනපති ඉවත්කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණය සතුවීම.

25. ප්‍රංශ ආණ්ඩුක්‍රමය,
1. ජනපති සහ අගමැති ප්‍රමුඛ දෙමුහුන් ආණ්ඩු ක්‍රමයකි.
2. අගමැතිවරයා ජනාධිපති විසින් පත් කරන ආණ්ඩු ක්‍රමයකි.
3. අමාත්‍ය මණ්ඩලය ජනාධිපති විසින් පත් කරන ආණ්ඩු ක්‍රමයකි.
4. පාර්ලිමේන්තුවට බැහැරින් කිසිවෙකු අමාත්‍ය මණ්ඩලයට පත් කළ නොහැකි ආණ්ඩුක්‍රමයකි.
5. පාර්ලිමේන්තු අනුමැතියට ඉදිරිපත්වන ආඥා කෙටුම්පත් සඳහා අනිවාර්ය අනුමැතිය ජනාපතිගේ අත්සනින් ලැබිය යුතු ආණ්ඩුක්‍රමයකි.

❖ **අංක 26 සිට 35 තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාවට හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.**

26. 1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය මගින් සිදුකළ යෝජනා නිසා මෙරට ඇති වූ වෙනස්කම් වන්නේ,
A නව ව්‍යාපාරික පංතියක් බිහිවීම.
B දේශීය අධ්‍යාපනය පුළුල් වීම.
C වෙළඳපොල ආර්කථියක් නිර්මාණය වීම.
D ඒකීය අධිකරණයක් සඳහා මාවත විවෘත වීම.
E පාලනය ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් කරා ක්‍රමිකව ගමන් කිරීමේ පදනම ගොඩනැගීම.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

27. කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය
A ප්‍රථම වරට සීමිත ඡන්ද බලය හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය විය.
B ව්‍යවස්ථාදායක සභාවේ මුළු මන්ත්‍රීන් සංඛ්‍යාව 21 දක්වා වර්ධනය වීමක් දැකිය හැකිවිය.
C නිලලත් මන්ත්‍රීවරුන්ගේ බහුතර ආධිපත්‍ය එසේම ආරක්ෂා කරන ලද ආණ්ඩු ක්‍රමයක් විය.
D ලාංකිකයන් වෙනුවනේ ඡන්දයෙන් මන්ත්‍රීවරුන් තිදෙනෙක් පත්කිරීමට දායක විය.
E ආණ්ඩුකාරවරයාගේ බලතල එසේම ආරක්ෂා කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් විය.
1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

28. 1924 මැනිං ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමය

A වගකීමෙන් බලය විසන්ධිකල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය කළේය.

B විධායක කටයුතුවල අවසාන බලය හා වගකීම ආණ්ඩුකරුට හිමිකර දුන්නේය.

C ව්‍යවස්ථාදායක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාව 49 දක්වා වර්ධනය කිරීමට දායකවිය.

D නිල නොලත් පිරිසේ බලය ඉතාමත් ඉහළ මට්ටමකට ගෙන ආ ආණ්ඩුක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ.

E අයවැය හා මූල්‍ය යෝජනා ආරම්භ කිරීමේ බලය ව්‍යවස්ථාදායක සභාවට පවරා දුන් ආණ්ඩු ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

29. මෙරට ජාතික ව්‍යාපාරය

A ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයක් පමණක් විය.

B ශක්තිමත් හෝ ඒකාබද්ධ ව්‍යාපාරයක් නොවීය.

C ඉතාමත් සාමකාමී ව්‍යාපාරයක් විය.

D අභ්‍යන්තර ස්වයං පාලනය දිනාගැනීම මූලික අරමුණක් බවට පත්විය.

E සියලු ජනයා සම්බන්ධ වූ ව්‍යාපාරයක් විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

30. ශ්‍රී ලංකාවේ වාමාංශික ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාල ප්‍රකාශය වන්නේ,

A නිදහස දිනාගැනීම මූලික අරමුණින් ක්‍රියාත්මක වීමයි. B පීඩිත ජනතාව අතර වේගයෙන් ප්‍රචලිත වීමයි.

C වඩාත් රැඩිකල්වාදීව ක්‍රියාත්මක වීමයි. D කම්කරු පංතියෙන් වියෝවීමයි.

E අනාගත සමාජවාදී සමාජයක් බිහි කිරීමට තැබූ පියවරක් ලෙස දිස්වීමයි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

31. 1931 සර්වජන ඡන්ද බලය ලැබීමෙන් මෙරට ඇති වූ වෙනස්කම් වූයේ,

A සමාජවාදී රටාවකට ලංකාව ගමන් කිරීමයි. B සුබ සාධක රාජ්‍යයක් කරා ගමන් කිරීමයි.

C කාන්තාව දේශපාලනයට එක්වීමයි. D දේශපාලන න්‍යාය සහ මතවාද රටතුලට ගලා ඒම සිදුවීමයි.

E බලය සඳහා දේශපාලන ප්‍රචණ්ඩත්වය ආරම්භ වීමයි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

32. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයේ මූලිකාංග අතර වූයේ,

A රාජ්‍ය මන්ත්‍රන සභාවක් පිහිටුවීමයි. B අමාත්‍ය මණ්ඩලයක් ස්ථාපිත කිරීමයි.

C විධායක කාරක සභා 7 ක් ක්‍රියාත්මක කිරීමයි. D අගමැතිට පැවරූ බලතල සීමා කිරීමයි.

E රාජ්‍ය නිලධාරීන් තිදෙනාට වැඩි බලපෑමක් කිරීමේ අවස්ථාව ලබාදීමයි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

33. 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව යටතේ 39 වගන්තියෙන් විධායක කාරක සභාවල කාර්යයන් ලෙස දක්වා ඇත්තේ,

A තම කාරක සභාවට පැවරී ඇති කාර්යයන් පිළිබඳ සුපරීක්ෂාකාරී වීම.

B එම කාර්යයන් භාරව කටයුතු කරන දෙපාර්තමේන්තු නිසි ආකාරයෙන් පාලනය කිරීම.

C සිය කාර්යයන් සම්බන්ධයෙන් විධායක කාරක සභා අගමැතිවරයාට වගකීම.

D අදාල දෙපාර්තමේන්තුවල කාර්ය ක්ෂේත්‍රයට අයත් ව්‍යවස්ථාදායක ප්‍රතිපත්ති තීරණය කිරීම.

E අදාල දෙපාර්තමේන්තු වල යම් යම් නිලධාරීන් පත්කිරීම පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

34. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාල ප්‍රකාශයන් වන්නේ,

A පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය හිමි නොවීම.

B වෙස්ට් මිනිස්ටර් ආකෘතිය අනුව සිදු වූ නිර්මානයක් වීම.

C ද්වි මාණ්ඩලික ව්‍යස්ථාදායකයක් ක්‍රියාත්මක වීම.

D විධායක බලය අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය වෙත පවරා තිබීම.

E ආණ්ඩුකරු සතුවූ බලතල සියල්ල අග්‍රාණ්ඩුකරු වෙත විතැන් කිරීම.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

35. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රමය

A සුළු ජනකොටස් ආරක්ෂා කරන වගන්ති සහිතව ඉදිරිපත් විය.

B නාමික විධායකයක් හඳුන්වා දීමක් සිදුවිය.

C අවසන් අධිකරණ බලය බ්‍රිතාන්‍ය සතුවිය.

D රැජිණ තව දුරටත් ශ්‍රී ලංකාව තුළ වලංගු දේශපාලන සාධකයක් නොවීය.

E සාමුහික වගකීමේ මූලධර්මය මත ක්‍රියාත්මක විය.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

❖ **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාවට හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඉන් හතරක් සාවද්‍ය ප්‍රකාශ වන අතර එම සාවද්‍ය ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.**

36. 1972 ව්‍යවස්ථාදායකය

A හැඳින්වූයේ රාජ්‍ය මන්ත්‍රණ සභාව ලෙසය

B සමන්විත වූයේ ඡන්දයෙන් හා නාමකරණයෙන් තෝරාගන්නා ලද මන්ත්‍රීවරුන්ගෙන් පමණි.

C නිල කාලය වසර පහකට සීමාවේ.

D උත්තරීතර බලයේ හිමිකරුවා ලෙස ක්‍රියාත්මක විය.

E දෝෂාභියෝග යෝජනාවක් සම්මත කිරීමෙන් පසු අගමැතිවරයා ඉවත් කළ හැකිවේ.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

37. 1972 ව්‍යවස්ථාවට අනුව,

A ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් ජනපති උපදෙස් මත අගමැති පත්කරයි.

B උසස් අධිකරණ ආයතනය වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය මහේස්ත්‍රාත් අධිකරණයන්ය.

C උපදේශාත්මක අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පැවරීම දැකිය හැකිවීය.

D ස්වාධීන අධිකරණ සේවා කොමිසමේ බලතල තව දුරටත් ස්ථාවර කරනු ලැබීය.

E අධිකරණ ආයතනය පිහිටුවීමේ සම්පූර්ණ බලය ජනාධිපතිවරයා සහ අගමැතිවරයා හවුලේ භුක්ති වින්දේය.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

38. 1978 ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවට අනුව,

A පාර්ලිමේන්තුව නමින් ද්වි මාණ්ඩලික ව්‍යස්ථාදායකයක් නිර්මාණය විය.

B පාර්ලිමේන්තුවේ සාමාජික සංඛ්‍යාව නිශ්චිත නොවන අතර, ජාතික ලැයිස්තුවෙන් පත්වන සංඛ්‍යාව වරින් වර වෙනස් වේ.

C වසර හතර හමාරක නිල කාලයක් සඳහා තෝරාගන්නා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත විය.

D ව්‍යවස්ථාදායක බලය පාර්ලිමේන්තුව විසින් ද ජනමත විචාරණයකදි ඍජුව ජනතාව විසින්ද ක්‍රියාත්මක කරනු ලැබේ.

E පාර්ලිමේන්තු මැතිවරණයක දී මුළු රටම එක් ඡන්ද කෝට්ඨාසයක් ලෙස සලකා මැතිවරණය පැවැත්වේ.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

39. 1978 ව්‍යවස්ථාවට අනුව,

A ජනාධිපතිගේ ධූර කාලය වසර 5 කි. එය 19 වන සංශෝධනයෙන් වසර 6 ක් ලෙස දීර්ඝ කෙරිනි.

B 18 වන සංශෝධනයෙන් ධූරය දැරියහැකි වාර ගණන 02 ක් ලෙසද 19 සංශෝදනයෙන් දැරිය හැකි වාර ගණනේ සීමාව ඉවත් කිරීමට ද සිදුවිය.

C 17 වන සංශෝධනය මගින් ශ්‍රී ලංකාවට පළාත් සභා ක්‍රමය හඳුන්වා දෙන ලදී.

D පාර්ලිමේන්තුව තුනෙන් දෙකක බහුතරයකින් සම්මත කොට ශ්‍රේෂ්ඨාධිකරණය ද අනුමත කරන්නේ නම් ජනාධිපති වරයාට ගෙන එන විශ්වාස භංග යෝජනාවකින් ධූරයෙන් ඉවත්කළ හැක.

E ජනාධිපතිවරයා ලෙස අපේක්ෂකයෙකු තේරී පත්වන්නේ භාවිතාකළ වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට පනහක් ඉක්මවා ඡන්දය ලබාගත් විටය.

1. ABCD  2. BCDE  3. ABDE  4. ACDE  5.ABCE

40. 1978 ව්‍යවස්ථාවට අනුව,

A ජාතික ලැයිස්තුවෙන් මන්ත්‍රීවරු 27 දෙනෙක් තෝරාපත්කර ගන්නා ලදී.

B පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසයක් දිනාගත් පක්ෂයේ නායකයා අගමැතිවරයා ලෙස තෝරාපත්කර ගන්නා ලදී.

C දේශපාලන විධායකය ලෙස අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලය ක්‍රියාත්මක වෙන ලදි.

D ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා තෝරා පත්කර ගැනීමට ක්‍රියාකරන ලදී.

E මූල්‍ය පාලනය පිළිබඳ පූර්ණ බලතල ජනාධිපතිවරයා වෙත කේන්ද්‍රගත කරන ලදි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

❖ **අංක 41 සිට 47 තෙක් ප්‍රශ්න සඳහා ඒ ඒ මාතෘකාව හා සම්බන්ධ ප්‍රකාශ පහක් ඉදිරිපත් කොට ඇත. ඒවායින් නිවැරදි වන්නේ ප්‍රකාශ හතරක් පමණි. නිවැරදි ප්‍රකාශ අන්තර්ගත කාණ්ඩය තෝරන්න.**

41. 1978 ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාට එරෙහිව ඉදිරිපත් වන දෝෂාභියෝග යෝජනාවක් සඳහා අදාල චෝදනා විය යුත්තේ,

A මහ බැංකු මූල්‍ය වංචා සිදුකිරීම.

B මානසික හෝ ශාරීරික ආබාධයකින් පෙළීම

C චරිත දූෂණය

D රාජ්‍ය ද්‍රෝහි වීම

E අල්ලස් හෝ වෙනත් දූෂණ චෝදනා වලට ලක්වීම.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

42. පළාත් සභා,

A පළාතට එකක් වන ලෙස පිහිටුවා ඇත.

B 1987 අංක 42 දරණ පනතට අදාලව පිහිටුවීමට පියවරගෙන ඇත.

C ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 13 වන සංශෝදනයට අනුව ක්‍රියාත්මක විය.

D පිහිටුවීමට මුල් වූ කරුණක් ලෙස උතුරු නැගෙනහිර ජනවාර්ගික අර්බුදය දැක්විය හැකිය.

E උතුරේ ක්‍රියාත්මක වූ LTTE සංවිධානයේ ප්‍රබල ඉල්ලීම් මත මෙය ලබාදුනි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

43. පළාත් ආණ්ඩුකාරවරයා

A ජනාධිපති විසින් තෝරා පත්කරනු ලබයි.

B පළාත් සභාවේ නාමික විධායකය ලෙස කටයුතු කරයි.

C ප්‍රධාන විධායක බලතල හා මූල්‍ය බලතල හිමිකරගනියි.

D මහ ඇමතිගේ නාමයෙන් ක්‍රියාත්මක වෙයි.

E පළාත් මහඇමතිවරයා පත් කිරීමට දායක වෙයි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

44. ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමයට අදාලව,

A 1935 ලංකා සම සමාජ පක්ෂය මුල්ම පක්ෂය ලෙස ආරම්භ විය.

B වාමාංශික පක්ෂ ක්‍රමයෙන් බෙදීයාමත් බලයෙන් අඩුවීමත් සිදුවිය.

C සමානුපාතික නියෝජනය හරහා බහු පක්ෂ රටාවක් නිර්මාණය විය.

D ජාතිවාදී පක්ෂ ක්‍රමයෙන් පක්ෂ භූමිකාවෙන් ඉවත් වීය.

E ප්‍රධාන පක්ෂ දෙකක් වටා බලය හුවමාරුවීම සිදුවීමේ ඉතිහාසයක් දැකිය හැකිවීම.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

45. 1978 ව්‍යවස්ථාවට එක්වූ 19 වන ව්‍යවස්ථා සංශෝධනය අනුව,

A අමාත්‍ය මණ්ඩලයේ මුළු සංඛ්‍යාව 30 නොඉක්මවිය යුතුවිය.

B ජනාධිපති ධූරය සඳහා ඉල්ලුම් කිරීමේ වයස් සීමාව අවු 30 ට අඩු කරන ලදී.

C පාර්ලිමේන්තුව පත්ව වසර හතර හමාරක් ගතවන තුරු ජනාධිපතිවරයාට එය විසුරුවා හැරිය නොහැකිවිය.

D නියෝජ්‍ය ඇමතිවරු සහ අමාත්‍ය මණ්ඩල නොවන ඇමතිවරුන්ගේ සංඛ්‍යාව 40 නොඉක්ම විය යුතුය.

E නිල කරුණු සම්බන්ධයෙන් ජනාධිපතිවරයාව අධිකරණයට කැඳවීමේ අයිතිය පුරවැසියන්ට හිමිවේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

46. වර්තමානයේ අධිකරණයේ ස්වාධීනත්වය සඳහා ගෙන ඇති ව්‍යවස්ථානුකූල ක්‍රියාමාර්ග වන්නේ,

A ජනාධිපතිවරයාගේ අත්සනින් ව්‍යවස්ථා සභාවේ අනුමැතිය සහිතව ශ්‍රේෂ්ඨාධිකරණ සහ අභියාචනාධිකරණ විනිසුරුවරයන් පත්කළ හැකි වුවත් ඉවත් කිරීම කළ නොහැක.

B විනිසුරුවන්ගේ වැටුප් ගෙවීම රජයේ ඒකාබද්ධ අරමුදල මගින් සිදු කිරීම.

C කිසිවෙකුට අධිකරණයට අභියෝග කිරීම හෝ අපහාස කිරීම කළ නොහැකි වීම.

D කිසිදු ඉහළ උසාවි විනිසුරුවරයෙකුට වෙනත් තනතුරක්, නිලයක්, දැරීම හෝ ඒ යටතේ වෘත්තියක යෙදීම තහනම් වේ.

E ශ්‍රේෂ්ඨාධිකරණයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව පුරවැසියෙකුට ගැටලුවක් ඇත්නම් ප්‍රිවි කවුන්සිලය හරහා යුක්තිය ඉල්ලා සිටිය හැක.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

47. සාර්ක් සංවිධානයට අදාලව,

A ආසියානු කලාපයට අයත් රටවල් එක්ව ආර්ථික සහයෝගීතාවය සඳහා පිහිටුවාගෙන ඇත.

B 1984 දෙසැම්බර් 08 දින ඩකා අගනුවරදී පිහිටුවාගන්නා ලදී.

C මේ වන විට එහි සාමාජික රටවල් සංඛ්‍යාව 08 කි.

D සාර්ක් සංවිධානයේ ලේකම් කාර්යාලය නේපාලයේ කත්මන්ඩු නුවර පිහිටා ඇත.

E දකුණු ආසියානු වරණාත්මක සහ නිදහස් වෙළඳ ගිවිසුම් දෙක (SAPTA – SAFTA) සාර්ක් සංවිධානයේ රටවල් අතර ඇතිකරගත් වැදගත් ගිවිසුම් දෙකකි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

❖ **පහතින් දැක්වෙන ප්‍රකාශ පදනම් කරගෙන අංක 48 සිට 49 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - ලෝක සාමය සහ ආරක්ෂාව පවත්වා ගෙන යාමේ අරමුණ.

B - යටත් විජිත ලෙස පැවති රාජ්‍ය අතර සහයෝගය තව දුරටත් රඳවා ගැනීම.

C - එයට අයත් සියලුම සාමාජිකයන්ගෙන් මහා මණ්ඩලය සමන්විත වේ.

D - ආරක්ෂක මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාව 15 ක් වීම.

E - 1944 දී පිහිටුවා ගනු ලැබුණි.

F - නායකයා බවට පත්වන්නේ රජු හෝ රැජිනයි.

G - 1967 ඉන්දුනිසියාවේ ජාකර්තා නුවරදී ආරම්භ විය.

H - සෑම රාජ්‍යක්ම පාහේ යටත් විජිත ලෙස පැවත නිදහස ලැබූ රාජ්‍යයන්ය.

I - ආරම්භය සඳහා සෘජුව බලපෑ වාර්තාව වූයේ 1839 ඩර්හැම් වාර්තාවයි.

J - විනිශ්චයකරුවන් 15 ක ගෙන් සමන්විත ජාත්‍යන්තර අධිකරණය මෙහි ප්‍රධානම අධිකරණයයි.

48. ඉහත ප්‍රකාශ වලින් එක්සත් ජාතීන්ගේ සංවිධානයට අදාල ප්‍රකාශ ඇතුලත් කාණ්ඩය තෝරන්න.

1. ABDJ 2. ACDJ 3. BCDH 4. AEGJ 5. ACEH

49. ඉහත ප්‍රකාශ වලින් පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් ප්‍රකාශ ඇතුලත් කාණ්ඩය තෝරන්න.

1. ABEG 2. BCDJ 3. BEHI 4. ABCD 5. ADEJ

50. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට අදාලව නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතනය වන්නේ මහනගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වේ.

B එය තම ප්‍රදේශය තුළ පොදු මංමාවත්, මහජන සෞඛ්‍යය, පොදු උපයෝගිතා සේවා පවත්වාගෙන යා යුතුය.

C 1987 ඉන්දු ලංකා සාම ගිවිසුම යටතේ පිහිටුවන ලදී.

D පළාත් සභාවල අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

E 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත මගින් පිහිටුවා ඇත.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5.ABCE

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

23 S II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 13 - 2018**

විභාග අංකය .............................

# දේශපාලන විද්‍යාව II

කාලය පැය තුනයි

- **1 සිට 20 දක්වා සියලු ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න. සම්පූර්ණ පිළිතුරකට ලකුණු 1ක් ද, අර්ධ පිළිතුරකට ලකුණු 1/2 ක් ද හිමි වේ.**
- **B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. එක් ප්‍රධාන ප්‍රශ්නයකට ලකුණු 20 ක් හිමිවේ.**

## A කොටස

01. දේශපාලන විද්‍යාව ගොඩනැගී ඇත්තේ මිනිසාගේ දේශපාලන හැසිරීම සහ ක්‍රියාකාරකම් සඳහා බලපාන සදාචාර මූලධර්ම, නිති මූලධර්ම, මානසික සාධක, ඓතිහාසික සාධක, සිතා ගැනීම් ආදී රැසක එකතුවෙනි. ඒ හෙයින් මෙම විෂය සමාජ විද්‍යාවකි. සමාජ විද්‍යාවක් බවට ඔප්පු කිරිම සඳහා සාධක 2 ක් ලියන්න.

    1. ......................................................................................................................................................

    2. ......................................................................................................................................................

02. පහත දැක්වෙන ප්‍රකාශ දෙකට අදාල ආයතන දෙක හඳුනාගෙන නම් කරන්න.

    - ජනතා නියෝජිතයන් රැස්ව රාජ්‍ය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නීති රීති සම්පාදනය කරන ස්ථානය.
    - සකස් කරන ලද නීති රීති නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ දැයි සොයා ඒ පිළිබඳ යුක්තිය පසිඳලීමේ කටයුතු කරන ආයතනය.

    1. ......................................................................................................................................................

    2. ......................................................................................................................................................

03. වර්තමානයේදී ජාතික රාජ්‍ය නම් වූ උත්තරීතර සමාජ සංවිධානයක් දක්නට ලැබේ. එහෙත් එම සංවිධානය සෙසු සමාජ සංවිධාන අභිබවා උත්තරීතර සහ අසහාය වී ඇත. එසේ වන්නේ කුමන සාධක ඇසුරින්ද? සාධක 02 ක් ලියන්න.

    1. ......................................................................................................................................................

    2. ......................................................................................................................................................

04. රාජ්‍යයක් සතුව පවතින ස්වාධිපත්‍යය බලය ආකාර දෙකකින් ක්‍රියාත්මක වේ. එම ආකාර දෙක නම්කරන්න.

1. ..................................................................................................................................................

2. ..................................................................................................................................................

05. පාලකයා බලය ලබා ගත යුතුය. ලබාගන්නේ කෙසේද යන්න වැදගත් නොවේ. ලබාගත් බලය රැකගත යුතුය. ව්‍යාප්ත කළ යුතුය. සතුරාට නිදැල්ලේ සිටීමට ඉඩ දිය යුතුය. නැතහොත් සමූල ඝාතනය කළ යුතුය. කෙනෙහිලි කම් නොකළ යුතුය. මේ ප්‍රකාශ ඇතුළත් කෘතිය සහ එය රචනා කළ චින්තකයා නම් කරන්න.

1. ..................................................................................................................................................

2. ..................................................................................................................................................

06. රාජ්‍ය අතිශයින් විශාලය. ප්‍රාදේශිය සම්පත් වලින් එකිනෙකට අසමානය. භාෂා, ආගම්, වාර්ගික ආදී බොහෝ සාධක වලින් බහුවිධය. වෙන් වී වෙනම රාජ්‍යයන් බිහිකර ගැනීමේ අවධානමක් පවතී. මේ සඳහා වඩාත් නිවැරදි විසඳුම ලෙස ගොඩ නගාගත් ආණ්ඩු ක්‍රමයක් මෙම ආණ්ඩුක්‍රමය පළමුව නිර්මානය කරගත් රාජ්‍යයන් පිළිවෙළින් නම් කරන්න.

1. ..................................................................................................................................................

2. ..................................................................................................................................................

07. මිනිසා තරගයෙන් තොරව තනිව ජීවත් විය. එහෙත් දේපල ඉපයීමත් සමග තරගයද, දේපල හිමිකාරිත්වය සමඟ පංති භේදයද බිහිවිය. අනාගත ලෝකයේ දී පංති භේදය නැතිවේ. පංති භේදය නිසා බිහිවූ රාජ්‍ය පංති භේදය නැතිවනදා අහෝසි වී යනු ඇත. මෙම මතවාදය ඉදිරිපත් කළ දේශපාලන දර්ශනයද රාජ්‍ය වියළී යන සමාජ අවධියද පිළිවෙලින් නම් කරන්න.

1. ..................................................................................................................................................

2. ..................................................................................................................................................

08. ''අප එකිනෙකා කුමක් කීවද අප සියලු දෙනා කිව යුත්තේ එක් දෙයකි''

(i) ඉහත අදහස ඉදිරිපත් කළ චින්තකයා නම් කරන්න.

..................................................................................................................................................

(ii) ඔහු මෙම අදහස ඉදිරිපත් කරන්නේ කුමක් පිළිබඳවද?

..................................................................................................................................................

09. ප්‍රාතන්ත්‍රවාදයට අනුව ඡන්ද දායකයා විසින් නියෝජිතයෙකු ව්‍යවස්ථා දායකයට ඡන්දයෙන් තෝරා යවයි. ඒ නිශ්චිත කාල සීමාවක් සඳහාය. එම කාලයේදී නියෝජිතයාට ඡන්ද දායකයා තමන් වෙතින් කුමක් බලාපොරාත්තු වේදැයි අමතකව යා හැක. ඒ හෙයින් නීති සම්පාදන කටයුතු සඳහා ජනතාවට ඍජුවම සම්බන්ධ වීමේ අවස්ථා ගණනාවක් ලබා දී ඇත. ඉන් අවස්ථා දෙකක් නම් කරන්න.

1. ..................................................................................................................................................

2. ..................................................................................................................................................

10. රටක පුද්ගලයෙකු දේශපාලන සමාජානුයෝජනයට නිරන්තරයෙන් ලක්වේ. ඒ සඳහා බලපාන සමාජානුයෝජන කාරකයන් රැසකි. දේශපාලන සංකේතද එහිදි වැදගත් මෙහෙයන් ඉටු කරයි. එවැනි දේශපාලන සංකේත දෙකක් නම් කරන්න.

1. ................................................................................................................................................

2. ................................................................................................................................................

11. 1833 ඇතිකළ කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය යටතේ හඳුන්වාදුන් යෝජනා රැසකි. ඉන් එක් යෝජනාවක් සඳහන් කොට එයින් රට තුළ ඇතිවූ අතිරේක ප්‍රතිඵලයක් සඳහන්කරන්න.

1. ................................................................................................................................................

2. ................................................................................................................................................

12. යටත් විජිත යුගයේදී මුල් වරට ව්‍යවස්ථාදායකයට ඡන්ද බලයෙන් නියෝජිතයෙක් තෝරා ගැනීම ආරම්භ කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක්ද? නියෝජිතයන් කී දෙනෙක් තෝරා ගන්නේද?

1. ................................................................................................................................................

2. ................................................................................................................................................

13. 1931 රාජ්‍ය මන්ත්‍රන සභාවේ මුළු සාමාජික සංඛ්‍යාව කීයද? ඡන්දයෙන් පත් වූ සංඛ්‍යාව කීයද?

1. ................................................................................................................................................

2. ................................................................................................................................................

14. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ අලුතින් හඳුන්වා දුන් අංග අතර රාජ්‍ය මන්ත්‍රන සභාව එකකි. එයට අමතරව හඳුන්වාදුන් නවාංග දෙකක් සඳහන් කරන්න.

1. ................................................................................................................................................

2. ................................................................................................................................................

15. 1948 පාර්ලිමේන්තුව ද්වි මාණ්ඩලික වේ. ඉන් එකක් වන්නේ සෙනෙට් මණ්ඩලයයි. එයට සාමාජිකයින් තෝරා ගත් ආකාර දෙක සහ ප්‍රමාණයන් දක්වන්න.

1. ................................................................................................................................................

2. ................................................................................................................................................

16. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හඳුන්වා දුන් විධායකය ද්විත්ව විධායකයකි. එම විධායකයන් දෙක නම් කරන්න.

1. ................................................................................................................................................

2. ................................................................................................................................................

17. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් රාජ්‍ය සේවයට අදාල වන මණ්ඩල දෙක දක්වන්න

1. ................................................................................................................................................

2. ................................................................................................................................................

18. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනතාව ව්‍යවස්ථා සම්පාදනය සඳහා සහභාගි වන ඍජු සහ වක්‍ර අවස්ථාවන් දෙක පිළිවෙලින් නම් කරන්න.

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

19. 1978 ව්‍යවස්ථාවට අනුව ව්‍යවස්ථාදායකයට මන්ත්‍රීවරු තෝරා ගන්නා ක්‍රම දෙකකි. එම ක්‍රම දෙක සහ ඒ යටතේ පත්වන අදාල මන්ත්‍රී සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

20. 19 සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ නිල කාලය සහ ධූරය දැරිය හැකි වාර ගණන වෙනස් විය. එහිදී සිදුවූ වෙනස සඳහන් කරන්න.

1. ..........................................................................................................................................................

2. ..........................................................................................................................................................

# දේශපාලන විද්‍යාව
## තෙවන වාර පරීක්ෂණය - 2018
## 13 ශ්‍රේණිය - II කොටස

- **B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.**

## B කොටස

01. පහත මාතෘකා දෙකෙන් එකක් සාකච්ඡා කරන්න.
   1. ඔබ දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය විග්‍රහ කරන්නේ කෙසේදැයි පැහැදිලිකරන්න.
   2. දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවකි. යන්න පිළිබඳව විමසුමක යෙදෙන්න. (10 x 2 = 20)

02. පහත දැක්වෙන මාතෘකා වලින් දෙකක් පිළිබඳව අදහස් දක්වන්න
   1. නූතන ආණ්ඩුක්‍රම තුළ ජනාධිපති විධායකයන් පැවතීමේ වාසි අවාසි
   2. මූලික අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ ක්‍රමවේදයන්
   3. ස්වාධිපත්‍ය පිළිබඳ න්‍යායේ වර්තමාන ප්‍රායෝගික බව පිළිබඳ විමසුමක්
   4. මිනිසුන් දේශපාලනය ඉගෙන ගන්නා ආකාරයන් (10 x 2 = 20)

03. පහත මාතෘකා වලින් දෙකක් විභාග කරන්න.
   1. ජාතික ආණ්ඩු - සභාග ආණ්ඩු සන්ධාන ආණ්ඩු අතර වෙනස්කම්.
   2. යහ පාලනය
   3. නව රාජ්‍යයක සිවිල් සමාජයේ භූමිකාව
   4. දේශපාලන සංස්කෘතිය (10 x 2 = 20)

04. පහත සඳහන් මාතෘකා වලින් දෙකකට පිළිතුරු සපයන්න.
   1. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සහ රැජිණ අතර ඇති ව්‍යවස්ථාදායක සබඳතා
   2. ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා ඉවත් කිරීමේ දෝෂාභියෝග ක්‍රියාවලිය
   3. ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රමයේ සාමූහික විධායකය
   4. ප්‍රංශ ජනාධිපතිරවයා සතු විධායක හා ව්‍යවස්ථාදායක බලතල හා කාර්යයන් (10 x 2 = 20)

## C කොටස

05. පහත මාතෘකා දෙකෙන් ඕනෑම එකක් පිළිබඳ විමසීමක යෙදෙන්න.
   1. ලංකාව නව දේශපාලන, ආර්ථික සමාජ රටාවකට ගෙන ගියේ 1833 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි. ඔබේ පිළිතුරට අදහස් දක්වන්න.
   2. ලංකා වාමාංශික ව්‍යාපාරය හෝ ලංකා ජාතික ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විමසුමක යෙදෙන්න. (10 x 2 = 20)

06. පහත දැක්වෙන මාතෘකා වලින් එකකට විවේචනාත්මක රචනයක් ලියන්න.
   1. 1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයෙන් ලැබුණු සර්වජන ඡන්ද බලය නිසා රට තුළ ඇතිවූ වෙනස්කම්.
   2. 1978 හා 1972 ව්‍යවස්ථාදායක ක්‍රියාකාරිත්වය.
   3. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ ධූරය සම්බන්ධයෙන් සිදුකළ වෙනස්කම්
   4. 1978 ව්‍යවස්ථාව මගින් හඳුන්වා දුන් ජනාධිපතිවරයා ඉවත් කිරීමේ නෛතික ක්‍රියාවලිය (10 x 2 = 20)

07. පහත සඳහන් මාතෘකා වලින් දෙකට පිළිතුරු ලියන්න.
   1. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්‍ෂා කිරීමට ශ්‍රී ලංකාවේ ඇති නීතිමය විධිවිධාන
   2. ප්‍රාදේශීය සභා සහ කොට්ඨාස පදනම් කරගත් ඡන්ද ක්‍රමය.
   3. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්‍ෂ කැඩී බෙදීයාමේ වර්තමාන නැඹුරුව
   4. 1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් මැතිවරණ ක්‍රමයෙන් ආගමික, ජාතිවාදී දේශපාලන පක්‍ෂ බිහිවීමේ නැඹුරුව (10 x 2 = 20)

08. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් පිළිබඳ අදහස් දක්වන්න.
   1. ශ්‍රී ලංකාව සහ අන්තර් ජාතික මානව හිමිකම් කොමිසම
   2. පොදු රාජ්‍ය මණ්ඩලය හා ශ්‍රී ලංකාව
   3. දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානය (SAARC)
   4. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයේ කාර්ය භාරය (10 x 2 = 20)

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018 - දේශපාලන විද්‍යාව

## <u>පිළිතුරු පත්‍රය</u>

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 3 | **11.** - 3 | **21.** - 4 | **31.** - 2 | **41.** - 2 |
| **02.** - 5 | **12.** - 1 | **22.** - 1 | **32.** - 5 | **42.** - 1 |
| **03.** - 2 | **13.** - 4 | **23.** - 3 | **33.** - 3 | **43.** - 5 |
| **04.** - 3 | **14.** - 5 | **24.** - 5 | **34.** - 1 | **44.** - 4 |
| **05.** - 1 | **15.** - 1 | **25.** - 4 | **35.** - 5 | **45.** - 1 |
| **06.** - 2 | **16.** - 4 | **26.** - 4 | **36.** - 5 | **46.** - 4 |
| **07.** - 1 | **17.** - 5 | **27.** - 5 | **37.** - 3 | **47.** - 2 |
| **08.** - 3 | **18.** - 3 | **28.** - 1 | **38.** - 5 | **48.** - 3 |
| **09.** - 5 | **19.** - 1 | **29.** - 1 | **39.** - 1 | **49.** - 3 |
| **10.** - 5 | **20.** - 3 | **30.** - 5 | **40.** -5 | **50.** - 3 |

## දේශපාලන විද්‍යාව II පිළිතුරු

## A කොටස

01. - මූලධර්මවල ඒකීය බවක් නැත - හේතුඵල වාදය අනුව නිශ්චිත අනාවැකි කීමට නොහැක.
 - පර්යේෂණාගාර භාවිතා කල නොහැක ආදී ලෙසින්

02. 1. ව්‍යවස්ථාදායකය 2. අධිකරණය

03. සමාජිකත්වය - නීතිය - ස්වාධිපත්‍ය බලය - ව්‍යාප්තිය කාලය අරමුණු ඉලක්ක ආදී ...

04. 1. අභ්‍යන්තර 2. බාහිර

05. 1. කුමාරයා - The Prince 2. නිකලෝ මැකියාවෙලි

06. 1. සන්ධීය ආණ්ඩු ක්‍රමය 2. ඇමරිකා එක්සත් ජනපදය

07. 1. සමාජවාදය (කොමියුනිස්ට් වාදය) 2. උත්තරීතර කොමියුනිස්ට් සමාජ අවධිය

08. 1. ඇක්ටන් සාමිවරයා 2. කැබිනට් සාමුහිකත්වය

09. ජනමත විචාරනය - ප්ලෙබිසයිට් පුනරාවර්තනය ආදී ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම

10. ජාතික කොඩිය - ජාතික ගීය, නිදහස් දිනය ආදී

11. උදා- රාජකාරි ක්‍රමය අහෝසි කිරිම මූල්‍ය ආර්ථිකය ක්‍රමය බිඳ වැටීමත් ලෙස ඒ ඒ යෝජනා සහ ප්‍රතිඵල

12. 1. කෲව් මැකලම් ව්‍යවස්ථාව 2. ඡන්දයෙන් 04

13. 1. 61 2. 50

14. අමාත්‍ය මණ්ඩලය - විධායක කාරක සභා ක්‍රමය රාජ්‍ය නිලධාරීන් - සර්වජන ඡන්ද බලය ආදිය...

15. අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකරු - 15
 මහජන මන්ත්‍රී මණ්ඩලය නියෝජනය කරන දේශපාලන පක්ෂ විසින් - 15

16. නාමික විධායකය - ජනාධිපතිවරයා දේශපාලන විධායකය - අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලය

17. - රාජ්‍ය සේවා උපදේශනය මණ්ඩලය - රාජ්‍ය සේවා විනය මණ්ඩලය

18. - නියෝජිතයන් පත්කොට පාර්ලිමේන්තුව මගින් - ජනමත විචාරනය මගින්

19. - දිස්ත්‍රික් පදනම - සමානුපාතික නියෝජනය 196 - ජාතික ලැයිස්තුව 29

20. - කාලය වසර 05 - දැරිය හැකි වාර ගණන 02 (1 බැගින් 20 - 20 )

## B කොටස

01. 1. රාජ්‍ය හා ආණ්ඩුවෙන් අරඹා දෙවන ලෝක යුද්ධයෙන් පසු එකතු වූ නවාංග සමග දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය විග්‍රහ කිරීම.
    2. සමාජ විද්‍යාව යනුවෙන් නිර්වචනය කොට විෂය අන්තර්ගතය අන්තර් විෂයාත්මක සබඳතා විෂය අධ්‍යයනවිධික්‍රම ඔස්සේ කරුණු දක්වමින් දේශපාලන විද්‍යාව සමාජ විද්‍යාවක් වන බව ඔප්පු කිරීම. (ලකුණු 20 )

02. 1. ජනාධිපති විධායකයේ ඇති වාසි අවාසි ආදිය පිළිබඳ විග්‍රහ කිරීම.
    2. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව - ශ්‍රේෂ්ඨාධිකරණය මානව හිමිකම් කොමිසම ආදිය පිළිබඳ විග්‍රහ කිරීම.
    3. ජාතික හා ජාත්‍යන්තර තත්ත්වයන් තුළ රටක ස්වාධිපත්‍ය න්‍යාය අභියෝගයට ලක්ව ඇති බව විග්‍රහ කිරීම.
    4. විධිමත් සහ අවිධිමත් ක්‍රම පිළිබඳව විමසීම. (ලකුණු 20 )

03. 1. මුළු රටම මුහුණ දෙන පොදු ගැටළුවකි ආර්ථික යුධමය දැඩි ආපදා හෝ ස්වාභාවික විපතකදී මුලු ව්‍යවස්ථා දායකයම ආණ්ඩුව ලෙස ක්‍රියාත්මක වීම. එයට විපක්ෂ හෝ වෙනත් කණ්ඩායම් නැති බව ගැටලු විසඳුනු විගස යළි වෙන්වූ කණ්ඩායම් ලෙස ආණ්ඩුව වෙනම ක්‍රියාත්මක වීම. පක්ෂ කිහිපයක් එකට එකතු වී ආණ්ඩුවක් පිහිටුවීම. ඒ මැතිවරණයෙන් පසුව බොහෝ විට කිසිදු පක්ෂයක් ආණ්ඩුවක් පිහිටුවීමෙන් බහුතරය ලබා නැතිනම් ආණ්ඩුවක් පිහිටුවීම සඳහාම එකතු වීම. මැතිවරණයට පෙර පක්ෂ දෙකක් හෝ කීපයක් පක්ෂ අනන්‍යතාව රැක ගනිමින් පොදු එකඟතාවයක් මත පිහිටුවාගන්නා ආණ්ඩු. මේ කොටස් 3 ට ඇතුලත්

    2. යහපාලනය හඳුන්වා යහපාලනය ගුණාංග පිළිබඳව විමසුමක යෙදීම.
    3. සිවිල් සමාජය හඳුන්වා ආණ්ඩුකරණය තුළ එහි කාර්යයභාරය පිළිබඳ විමසීමක යෙදීම
    4. දේශපාලන සංස්කෘතිය යනු කුමක්දැයි හඳුන්වා ඒ පිළිබඳව විධිමත් විමසුමක යෙදීම. (ලකුණු 20 )

04. 1. බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව හා රැජින අතර පවතින ව්‍යවස්ථාදායක සබඳතා පිළිබඳව විමසා බැලීම
    2. ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා ඉවත්කිරීම සඳහා භාවිතා කරන දෝෂාභියෝග ක්‍රියාවලිය පිළිබඳ විමසීමක යෙදීම.
    3. ස්විට්ස්ර්ලන්ත ආණ්ඩුක්‍රමයේ සාමුහික විධායකය එහි බලතල හා කාර්යයන් පිළිබඳ විමසුමක යෙදිම.
    4. ප්‍රංශ ජනාධිපතිවරයා සතු ව්‍යවස්ථාදායක විධායක බලතල හා කාර්යයන් පිළිබඳ විමසුමක යෙදීම. (ලකුණු 20 )

## C කොටස

05. 1. 1933 කෝල්බෲක් කැමරන් ආණ්ඩුක්‍රමය නිසා ලැබුණු සමාජ ආර්ථික දේශපාලන ප්‍රතිඵල පිළිබඳ විමසුමක යෙදීම
    2. ලංකා වාමාංශික ව්‍යාපාරය බිහිවීමට බලපෑ හේතු හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව විමසුමක යෙදීම.
    3. ලංකා ජතික ව්‍යාපාරය ආරම්භක ක්‍රියාකාරිත්වය පිළිබඳ විධිමත් විමසුමක යෙදීම. (ලකුණු 20 )

06. 1. සර්වජන ඡන්ද බලය ලැබීම නිසා ඇතිවූ යහපත් හා අයහපත් ප්‍රතිඵල පිළිබඳ විමසුමක යෙදීම.
    2. 1948 හා 1972 ව්‍යවස්ථාදායකයක් සතු වූ බලතල හා කාර්යයන් ඒවායේ ක්‍රියාකාරිත්වය ක්‍රියාත්මක වීමේදී 1948 ව්‍යවස්ථාදායකය උත්තරීතර ආයතනයක් නොවූ බවත් 1972 ජාතික රාජ්‍ය සභාව උත්තරීතර බලතල වලින් යුතු ආයතනයක් වූ බවත් පැහැදිලි කිරීම.
    3. 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ආශ්‍රිතව ජනාධිපතිධූරයේ සිදුවූ වෙනස්කම් පිළිබඳව විධිමත් විග්‍රහයක යෙදීම.
    4. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හඳුන්වාදුන් ජනාධිපතිවරයා ඉවත්කිරීමේ නීතිමය ක්‍රියාවලිය පිළිබඳව විධිමත් විග්‍රයක යෙදීම. (ලකුණු 20 )

07. 1. අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂාකිරිමට ලංකාව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග විනිශ්චයකරුවන් පත්කිරීම මාරුකිරීම, සේවයේ සුරක්ෂිතතාව ආදී කාර්යයන් විමසීම.
    2. ප්‍රාදේශීය සභා සහ කොට්ඨාශ පදනම් කරගත් ඡන්ද ක්‍රමය පිළිබඳ විධිමත් විමසුමක යෙදීම.
    3. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ වර්තමානයේ කැඩී බිඳී යන ආකාරය පිළිබඳ වර්තමාන තත්ත්වය හා ගලපමින් විධිමත් විග්‍රහයක යෙදීම.
    4. 1978 ආගමික ජාතිවාදය දේශපාලන පක්ෂ බිහිවීමේ නැඹුරුව පිළිබඳ විධිමත් විග්‍රහයක යෙදීම. (ලකුණු 20 )

08. 1. අන්තර්ජාතික මානව හිමිකම් කොමිෂම කෙරෙහි ශ්‍රී ලංකාව සම්බන්ධ වන ආකාරය පිළිබඳව විග්‍රහ කිරීම.
    2. පොදු රාජ්‍ය මණ්ඩලය තුළ ලංකාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව විග්‍රහ කිරීම.
    3. සාර්ක් සංවිධානය හා එය පිහිටුවා ගැනීමේ අරමුණු බලතල හා කාර්යයන් පිළිබඳව විග්‍රහයක යෙදීම.
    4. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩලයේ කාර්ය භාරය පිළිබඳව විග්‍රහ කිරීම. (ලකුණු 20 )